# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2505/76 - 2026 සැප්තැම්බර් මස 09 වැනි බදාදා - 2026.09.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්.ඩී-බී. 5/2025**

**2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 25 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ඇ) ඡේදය සමග කියවිය යුතු එකී පනතේ 48 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති.

සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.

2026 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

**1.** මේ රීති 2026 විදුලිබල (පාරිභෝගිකයන්ගේ දුක්ගැනවිලි සඳහා සහනය සැලසීමේ සංසදය) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන කොටස**

**විදුලිබල පාරිභෝගිකයන්ගේ දුක්ගැනවිලි සඳහා සහනය සැලසීමේ සංසදය පිහිටුවීම.**

**2.** කාලෝචිත සහ ඵලදායී ආකාරයෙන් පාරිභෝගිකයන්ගේ දුක්ගැනවිලි විමසීමට සහ ඒ සඳහා සහනය සැලසීමට වේදිකාවක් සැපයීම සඳහා (මෙහි මින්මතු “සංසදය” යනුවෙන් සඳහන් කරනු ලබන) “විදුලිබල පාරිභෝගිකයන්ගේ දුක්ගැනවිලි සඳහා සහනය සැලසීමේ සංසදය” යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සංසදයක් පිහිටුවනු ලැබිය යුතු ය.

**3.** (1) බලපත්‍රලාභියා විසින්, (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විමසා, පිහිටුවනු ලබන සංසද සංඛ්‍යාව සහ ඒවා පවත්වනු ලබන ස්ථාන සහ ඒ එක් එක් සංසදයේ විෂය ක්ෂේත්‍රය යටතට අයත් විය යුතු බලපත්‍රලාභියාගේ සැපයුම් ප්‍රදේශ නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රලාභියා විසින්, පිහිටුවනු ලබන සංසද සංඛ්‍යාව සහ ඒවා පවත්වනු ලබන ස්ථාන නිශ්චය කිරීමේ දී-

(අ) බලපත්‍රලාභියා විසින් සේවය සපයනු ලබන පාරිභෝගිකයන්ගේ සංඛ්‍යාව; සහ

(ආ) දුක්ගැනවිල්ල සඳහා කාලෝචිතව සහනය සැලසීම තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් වන සංසද සංඛ්‍යාව,

යන කාරණා පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

**4.** (1) යම් සංසදයක් වෙත භාරදෙනු ලබන දුක්ගැනවිලි සංඛ්‍යාව සහ ඒවායේ ස්වභාවය මත පදනම්ව, බලපත්‍රලාභියාට සහ පාරිභෝගිකයාට පහසුවන්නා වූ යම් ස්ථානයක සිට එම දුක්ගැනවිලි සඳහා සහනය සැලසීම පිණිස ඒ සංසදය විසින් ඕනෑම රැස්වීම් සංඛ්‍යාවක් පවත්වනු ලැබිය හැකි ය.

(2) දුක්ගැනවිල්ල සඳහා සහනය සැලසීම සඳහා පහසුකම් සැලසීමට යම් ක්ෂේත්‍ර පරීක්ෂණයක් මගින් හැකියාව ඇති අවස්ථාවක, සංසදය විසින් ඒ පරීක්ෂණය පවත්වනු ලැබිය හැකි ය.

**5.** (1) සංසදය, බලපත්‍රලාභියා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය:-

(අ) (2) වන අනුරීතියට අනුකූලව බලපත්‍රලාභියා විසින්, පහත දැක්වෙන තැනැත්තන් අතරින් (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සංසදයේ සභාපතිවරයා තෝරා ගනු ලැබිය යුතු ය:-

(i) රජයේ ලියාපදිංචි වී ඇති වෘත්තිකයන්ගේ සංගමයක යම් සාමාජිකයකු;

(ii) විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ රජයේ නිලධරයකු; හෝ

(iii) විශ්‍රාමලත් අධිකරණ නිලධරයකු;

(ආ) බලපත්‍රලාභියාගේ කාර්යාලයේ සේවය කරනු ලබන විධායක කාර්ය මණ්ඩලයේ තැනැත්තන් අතරින් එක් තැනැත්තකු හෝ ඉංජිනේරු වෘත්තිකයන්ගේ සංවිධානයක ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු; සහ

(ඇ) කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂකවරයකුගේ නිලයට වඩා පහළ නොවන යම් නිලයක් දරනු ලබන යම් නිලධරයකු හෝ පාරිභෝගික උපදේශකවරයකු.

(2) බලපත්‍රලාභියා විසින්, (1) වන අනුරීතියේ (අ)(i), (අ)(ii) සහ (අ)(iii) ඡේදවල සඳහන් තැනැත්තන් කාණ්ඩවලට අයත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවීමේ සහ ඒවා සලකා බැලීමේ ක්‍රියාවලියක් මගින් තැනැත්තන් තිදෙනෙකු තෝරා ගනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාවේ අනුමතය සඳහා ඒ තැනැත්තන්ගේ නම් නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(3) (2) වන අනුරීතිය යටතේ බලපත්‍රලාභියාගේ නිර්දේශය ලැබුණු විට, කොමිෂන් සභාව විසින්, ඒ තැනැත්තන්ගෙන් යම් එක් තැනැත්තකු සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(4) විදුලිබල කර්මාන්තය තුළ යම් ආස්ථිත්වයක් සම්බන්ධයෙන් හෝ සංසදයේ කර්තව්‍ය ඉටු කිරීමේදී ස්වකීය බැඳියාවන් අතර ගැටුමක් ඇති කළ හැකි යම් ඍජු හෝ වක්‍ර මූල්‍යමය හෝ වෙනත් බැඳියාවක් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබීමට තෝරා ගනු ලබන තැනැත්තාට නොමැති බවට බලපත්‍රලාභියා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

**6.** (1) සංසදයේ කාර්ය මණ්ඩලය, අවම වශයෙන් පහත දැක්වෙන සේවක සංඛ්‍යා තනතුරුවලින් සමන්විත විය යුතු ය:-

(අ) සංසදය සඳහා ලේකම්වරයකු;

(ආ) පරිගණක ක්‍රියාකරුවකු; සහ

(ඇ) කාර්යාල කාර්ය සහායකවරයකු.

(2) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන සුදුසුකම්, (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සංසදයේ ලේකම්වරයාට තිබිය යුතු ය.

(3) ලේකම්වරයා, සංසදයේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා සහාය විය යුතු අතර, භාරගත් බවට වන නිසි ලෙස දැනුම්දීමක් සිදුකර දුක්ගැනවිලි භාර ගැනීම, වාර්තා තබා ගැනීම සහ ලැබෙන සියලු දුක්ගැනවිලි පිළිබඳව දත්ත සමුදායක් පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය යුතු ය.

**7.** සංසදයේ සෑම සාමාජිකයකු ම, ඉල්ලා අස්වීමෙන්, මියයාමෙන් හෝ ධුරයෙන් ඉවත් කිරීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස, ඒ සාමාජිකයා පත්කළ දින සිට වසර පහක කාලසීමාවක් සඳහා ධුරය දරනු ලැබිය යුතු අතර ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත පත් කිරීමට සුදුස්සකු විය යුතු ය:

එසේ වුව ද, සභාපතිවරයා වයස අවුරුදු හැටපහට එළඹුන විට, ධුර කාලය ඉකුත් නොවුව ද, එය නොසලකා ඔහු විසින් ධුරය දැරීම අවසන් කරනු ලැබිය යුතු ය. අනෙකුත් සාමාජිකයන් ඔවුන්ගේ ධුර කාල අවසන් වන තෙක් ධුර දැරීම දිගටම සිදු කළ හැකි ය.

**8.** සභාපතිවරයා විසින් ධුර කාලය ඉකුත් වීමට පෙරාතුව ස්වකීය ධුරය හිස් කරනු ලබන්නේ නම්, 5 වන රීතියේ (2) වන අනුරීතියේ සඳහන් කරන ලද තැනැත්තන් අතරින් වෙනත් යම් තැනැත්තකු ඒ ධුර කාලයේ ඉකුත් නොවූ කාලසීමාව සඳහා සභාපතිවරයා ලෙස පත්කිරීමට කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි ය.

**9.** යම් තැනැත්තකු -

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු ව සිටීම නතර වේ නම්;

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ පත් කරනු ලැබීමට පෙරාතුව වූ අවුරුදු තුනක් ඇතුළත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ව, පළාත් සභා මන්ත්‍රීවරයකු ව හෝ පළාත් පාලන ආයතනයක සභිකයකුව සිට ඇත්තේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට හඳුනා ගනු ලබන්නේ නම් හෝ ප්‍රකාශ කරනු ලබන්නේ නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් ලිඛිත නීතියක් යටතේ වස්තු භංගත්වයට හෝ බුන්වත්භාවයට පත්ව ඇති බවට ප්‍රකාශ කරනු ලැබ හෝ වස්තු භංගත්වයට හෝ බුන්වත්භාවයට පත්ව නිදහස් කරනු ලැබ නොමැත්තේ නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් යම් අපරාධමය වරදකට වරදකරු කරනු ලැබ ඇත්තේ නම්; හෝ

(ඊ) සංසදයේ සාමාජිකයකු වශයෙන් ඒ තැනැත්තා වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමෙන් ඒ තැනැත්තා වලක්වනු ලබන යම් මානසික හෝ ශාරීරික දුබලතාවකින් පෙළෙන්නේ නම්,

ඒ තැනැත්තා සංසදයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සමාජිකයකු ලෙස දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

**10.** (1) සංසදයේ යම් පුරප්පාඩුවක් ඇති වූ විට, කොමිෂන් සභාව සහ බලපත්‍රලාභියා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ පුරප්පාඩුව ඇති වූ දින සිට දින හැටක් තුළ එම පුරප්පාඩුව පිරවීමට වහා ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

(2) සංසදයේ සංයුතියේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා ම පමණක් සංසදයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

**11.** කොමිෂන් සභාවේ අනුමතය සහිතව, බලපත්‍රලාභියා විසින් සංසදයේ සාමාජිකයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කරනු ලැබිය යුතු ය.

**12.** කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට යටත්ව, සංසදයේ කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ මානව සම්පත් බලපත්‍රලාභියා විසින් සපයනු ලැබිය යුතු ය.

**13.** සංසදයේ කාර්යාලය, බලපත්‍රලාභියාගේ කාර්යාලයේ සියලුම වැඩ කරන දිනවල දී වැඩ කරන වේලාවන් තුළ විවෘතව තැබිය යුතු ය.

**14.** සංසදය විසින්, ලැබෙන දුක්ගැනවිලි සංඛ්‍යාව මත පදනම්ව, උචිත යයි සලකනු ලබන පරිදි ස්වකීය කටයුතු සිදු කරනු ලබන ආකාරය, බලපත්‍රලාභියාගේ සැපයුම් ප්‍රදේශය තුළ සංසදය පවත්වනු ලබන ස්ථානය, දිනය සහ වේලාව නිශ්චය කරනු ලැබිය යුතු ය.

**15.** බලපත්‍රලාභියා විසින්, කලින් කලට, සුදුසු යයි සංසදය විසින් සලකනු ලබන ආකාරයට හෝ කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට සංසදය පිළිබඳව සහ එහි කර්තව්‍ය පිළිබඳව නිසි ප්‍රචාරයක් ලබා දෙනු ලැබිය යුතු ය.

**16.** යම් ඉලෙක්ට්‍රොනික සන්නිවේදන ක්‍රමයක් ඇතුළුව සංසදයේ නිල තැපැල් ලිපිනය, දුරකථන අංක සහ වෙනත් යම් සම්බන්ධ විය හැකි ආකාර පිළිබඳ තොරතුරු, පාරිභෝගිකයා සමඟ සම්බන්ධ වීම සඳහා යොදාගන්නා බලපත්‍රලාභියාගේ සියලු කාර්යාලවල ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු අතර, පාරිභෝගිකයන්ගේ විදුලි බිල්පත්වල ද නිසි පරිදි පළ කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

### සහනය සැලසීමේ කාර්යපටිපාටිය

**17.** (1) බලපත්‍රලාභියාගේ සැපයුම් ප්‍රදේශය තුළ, විදුලිබල සේවාවන් ලබන පාරිභෝගිකයන් විසින්, ස්වකීය දුක්ගැනවිලි සහනයක් ලබා ගැනීම පිණිස සංසදය වෙත භාරදෙනු ලැබිය හැකි ය.

(2) සංසදය වෙත දුක්ගැනවිල්ලක් පෞද්ගලිකව ලැබෙන අවස්ථාවක දී, යොමු අංකයක් ද සහිතව එය භාරගත් බවට කරනු ලබන දැනුම්දීමක් වහාම ඔහු වෙත නිකුත් කරනු ලැබිය යුතු අතර, තැපැල් මගින් හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික ක්‍රමයක් මගින් දුක්ගැනවිල්ලක් ලැබෙන අවස්ථාවක දී, සංසදය වෙත ඒ දුක්ගැනවිල්ල ලැබුණු දින සිට වැඩ කරන දින පහක් ඇතුළත ඒ දුක්ගැනවිල්ල ලැබුණු බවට කරනු ලබන දැනුම් දීමක් පාරිභෝගිකයාට නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) සංසදය වෙත දුක්ගැනවිල්ලක් වාචිකව ලබා දෙන අවස්ථාවක දී, ලේකම්වරයා විසින්, ඒ දුක්ගැනවිල්ල ලේඛනගත කර ඊට පාරිභෝගිකයාගේ අත්සන ලබාගත යුතු අතර, එය දත්ත සමුදායට උඩුගත කරනු ලැබිය යුතු ය. අදාළ පාරිභෝගිකයාට එහි පිටපතක් වහාම ලබා දෙනු ලැබිය යුතු ය.

**18.** (1) 17 වන රීතිය යටතේ යම් පාරිභෝගිකයකුගේ දුක්ගැනවිල්ලක් ලැබුණු විට, ලේකම්වරයා විසින්, පැමිණිලි කරන ලද දුක්ගැනවිල්ල සම්බන්ධයෙන් වන සංක්ෂිප්ත වාර්තාවක් ද සමග දුක්ගැනවිල්ල සභාපතිවරයාට යොමු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන අනුරීතිය යටතේ ඒ යොමු කිරීම ලැබුණු විට, සභාපතිවරයා විසින්, දුක්ගැනවිල්ලේ ස්වභාවය සැලකිල්ලට ගෙන -

(අ) බලපත්‍රලාභියා විසින් දුක්ගැනවිල්ල විසඳනු ලැබිය හැකි ද; හෝ

(ආ) සංසදය විසින් දුක්ගැනවිල්ල විසඳනු ලැබිය යුතු ද,

යන්න නිශ්චය කරනු ලැබිය යුතු ය.

**19.** (1) බලපත්‍රලාභියා විසින් දුක්ගැනවිල්ල විසඳනු ලැබිය හැකි බවට සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක දී, සභාපතිවරයා විසින් ඒ දුක්ගැනවිල්ල බලපත්‍රලාභියා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, බලපත්‍රලාභියා වෙත ඒ දුක්ගැනවිල්ල ලැබුණු දින සිට දින දහහතරක් ඇතුළත ඒ දුක්ගැනවිල්ල විසඳීමට බලපත්‍රලාභියා විසින් සෑම උත්සාහයක් ම දරනු ලැබිය යුතු ය.

(2) (1) වන අනුරීතිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ ඒ දුක්ගැනවිල්ල විසඳීමට බලපත්‍රලාභියා අපොහොසත් වන්නේ නම්, හෝ බලපත්‍රලාභියා විසින් යෝජනා කරනු ලබන විසඳුම සම්බන්ධයෙන් පාරිභෝගිකයා සෑහීමකට පත් නොවන්නේ නම්, බලපත්‍රලාභියා හෝ පාරිභෝගිකයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ අපොහොසත් වීම හෝ සෑහීමකට පත් නොවීම පිළිබඳව, බලපත්‍රලාභියාට ඒ දුක්ගැනවිල්ල ලැබුණු දින සිට දින විසි එකක් ඇතුළත සංසදය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

**20.** (1) (අ) 18 වන රීතිය යටතේ සංසදය විසින් දුක්ගැනවිල්ල විසඳිය යුතු බවට සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක දී; හෝ

(ආ) 19 වන රීතිය යටතේ බලපත්‍රලාභියා දුක්ගැනවිල්ල විසඳීමට අපොහොසත් වන අවස්ථාවක දී හෝ බලපත්‍රලාභියා විසින් යෝජනා කරනු ලබන විසඳුම පිළිබඳව පාරිභෝගිකයා සෑහීමකට පත් නොවන අවස්ථාවක දී,

සභාපතිවරයා විසින්, සංසදය වෙත දුක්ගැනවිල්ල යොමු කරනු ලැබිය යුතු අතර, ලේකම්වරයා විසින් දුක්ගැනවිල්ල පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා සංසදයේ සාමාජිකයන්ගේ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(2) දුක්ගැනවිල්ල සමාලෝචනය කිරීමේ දී, අන්‍යෝන්‍ය වශයෙන් පිළිගනු ලැබිය හැකි විසඳුමක් ලබාදීමෙන් දුක්ගැනවිල්ල විසඳීමට සංසදයේ සාමාජිකයන් විසින් උත්සාහ දරනු ලැබිය යුතු ය.

(3) සංසදයේ සියලු සාමාජිකයන් යම් විසඳුමකට එකඟවන අවස්ථාවක දී හෝ සභාපතිවරයා සහ අවම වශයෙන් සංසදයේ එක් සාමාජිකයකු යම් විසඳුමකට එකඟවන අවස්ථාවක දී, පාරිභෝගිකයාට සහ බලපත්‍රලාභියාට දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනයේ දී සංසදය ඉදිරියේ පෙනී සිටින ලෙසට දැන්වීමක් නිකුත් කරන ලෙස සභාපතිවරයා විසින් ලේකම්වරයාට උපදෙස් ලබාදිය යුතු ය.

(4) බලපත්‍රලාභියාට ලබාදෙන දැන්වීම, දුක්ගැනවිල්ලේ පිටපතක් සහ ඒ සමඟ අමුණා ඇති යම් ලේඛන ඇත්නම් ඒවායේ පිටපත් ද සමග ලබා දිය යුතු ය.

(5) යම් පාරිභෝගිකයකු විසින්, 17 වන රීතිය යටතේ සංසදය වෙත ඉදිරිපත් කරන ලද යම් දුක්ගැනවිල්ලක් සම්බන්ධයෙන් එම පාරිභෝගිකයා නියෝජනය කිරීම සඳහා පාරිභෝගික උපදේශකවරයකුගේ සහාය ලබාගනු ලැබිය හැකි ය.

**21.** (1) පාරිභෝගිකයා සහ බලපත්‍රලාභියා විසින්, සංසදය ඉදිරියේ කරුණු දැක්වීම සිදුකරනු ලැබිය යුතු අතර එම කරුණු තහවුරු කිරීම සඳහා යම් ලේඛන හෝ වෙනත් අදාළ ද්‍රව්‍ය ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. සංසදය විසින්, සංසදයේ සාමාජිකයන් විසින් එළඹෙන ලද විසඳුම දැනුම් දීමට පෙරාතුව සංසදය ඉදිරියේ කරුණු දැක්වීමට දෙපාර්ශ්වයට ම සමාන අවස්ථා ලබාදිය යුතු ය.

(2) බලපත්‍රලාභියා හෝ පාරිභෝගිකයා විසින් කරන ලද කරුණු දැක්වීම් සහ ඒවා තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලේඛන හෝ ද්‍රව්‍ය සලකා බැලීමෙන් පසුව, පාරිභෝගිකයා විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගනිමින්, සංසදය විසින් එළඹෙන ලද විසඳුම සංශෝධනය කරනු ලැබීමට අවශ්‍ය බවට සංසදයට පෙනී යන අවස්ථාවක දී, සභාපතිවරයා විසින්, එම අවස්ථාවේ දී ම සංසදයේ සාමාජිකයන්ගෙන් විමසා යෝජිත විසඳුම නැවත සලකා බලනු ලැබිය හැකි ය.

(3) 20 වන රීතිය යටතේ සංසදය විසින් එළඹෙන ලද විසඳුම පිළිබඳ පාරිභෝගිකයා සෑහීමකට පත් නොවන අවස්ථාවක දී, හෝ සංසදය විසින් එසේ කළයුතු යයි තීරණය කරනු ලබන අවස්ථාවක දී, විසඳීම සඳහා දුක්ගැනවිල්ල කොමිෂන් සභාවට යොමු කරනු ලැබිය යුතු ය.

**22.** දුක්ගැනවිල්ලක් සෑහීමකට පත්වන අයුරින් විසඳා ගැනීම සඳහා, යම් පාර්ශ්වයක සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලේඛන හෝ තොරතුරු ඉදිරිපත් කිරීම අවශ්‍ය බවට සංසදය විසින් සලකනු ලබන අවස්ථාවක දී, ස්වකීය සන්තකය හෝ පාලනය යටතේ පවතින එකී ලේඛන හෝ තොරතුරු ඉදිරිපත් කරන ලෙසට කවර හෝ පාර්ශ්වයකට සංසදය විසින් නියම කරනු ලැබිය හැකි ය. *නැතහොත්* සංසදය විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරිදි තමන් විසින් ම හෝ නිසි සුදුසුකම්ලත් තැනැත්තකු මගින් ඒ සම්බන්ධයෙන් පෞද්ගලික පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ය.

**23.** සංසදය, යුක්තිය, සාධාරණත්වය සහ යහපත් හෘද සාක්ෂිය පිළිබඳ මූලධර්ම මගින් මෙහෙයවනු ලැබිය යුතු අතර ඊට අනුකූලව ස්වකීය කාර්යය පටිපාටිය නියාමනය කරනු ලැබිය හැකි ය.

**24.** පාරිභෝගිකයා හෝ බලපත්‍රලාභියා, තමන් විසින් ම හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු මගින් සංසදය ඉදිරියේ පෙනී සිටිනු ලැබිය හැකි ය.

**25.** (1) සංසදය විසින් දුක්ගැනවිල්ල භාරගත් දින සිට දින තිහක් ඇතුළත 17 වන රීතිය යටතේ නිසි පරිදි එය වෙත භාර දෙන ලද දුක්ගැනවිල්ලක් සම්බන්ධයෙන් විසඳුමකට එළඹීම සඳහා සංසදය විසින් උත්සාහ දරනු ලැබිය යුතු ය.

(2) (1) වන අනුරීතියේ නිශ්චිතව දක්වන ලද කාලසීමාව ඇතුළත යම් විසඳුමකට එළඹීමට සංසදයට නොහැකිවන අවස්ථාවක දී, සංසදය විසින් එකී ප්‍රමාදය සඳහා හේතු වාර්තා කරනු ලැබිය යුතු අතර එකී හේතු, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ස්වකීය කාර්තුමය වාර්තාවට ඇතුළත් කරනු ලැබිය යුතු ය.

**26.** සංසදය විසින් යම් දුක්ගැනවිල්ලක් භාර ගැනීමෙන් පසුව සහ අවසන් විසඳුමකට එළඹීමට පෙර යම් අවස්ථාවක දී, දුක්ගැනවිල්ල විසඳනු ලබන තෙක් පවත්නා තත්ත්වය ආරක්ෂා කිරීමට, පාරිභෝගිකයාට වැඩිදුර අගතියක් සිදුවීම වැළැක්වීමට හෝ කවර හෝ පාර්ශ්වයකට සිදුවන මූල්‍යමය අලාභය වැළැක්වීමට අවශ්‍ය බවට එය විසින් සලකනු ලබන යම් අතුරු පියවර ගනු ලැබිය හැකි ය.

**27.** සංසදයේ සෑම විසඳුමක් සහ කටයුත්තක් ම, එකී කටයුතු සඳහා සහභාගී වන ලද සංසදයේ සියලු ම සාමාජිකයන් විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. සංසදය විසින් නිකුත් කරන ලද හෝ දැනුම් දෙන ලද එකී යම් විසඳුමක් හෝ කටයුත්තක් පිළිබඳ සෑම පිටපතක් ම ලේකම්වරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

**28.** සංසදය විසින් එළඹෙන ලද සියලු අවසන් විසඳුම් සහ සංසදය විසින් ගන්නා ලද යම් අතුරු පියවර, විසඳුමට එළඹෙන ලද හෝ පියවර ගන්නා ලද දිනයේ සිට දින තුනක් තුළ දුක්ගැනවිල්ලේ පාර්ශ්වයන්ට සහ එකී විසඳුම හෝ පියවර බලාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වග කියනු ලැබිය යුතු යම් තැනැත්තකුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

**29.** (1) සංසදය විසින් ස්වකීය විසඳුම තුළ එම විසඳුම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු කාලසීමාව නිශ්චිතව දක්වා නොමැති නම්, බලපත්‍රලාභියා විසින්, එකී විසඳුම ලැබුණු දින සිට දින පහළොවක් ඇතුළත එකී ක්‍රියාමාර්ගය ගනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ පිළිබඳව සංසදයට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) සංසදය විසින්, බලපත්‍රලාභියා විසින් කරනු ලබන යම් ඉල්ලීමක් මත විසඳුම ලැබුණු දිනයේ සිට මාසයක් නොඉක්මවන තවත් කාලසීමාවක් සඳහා, විසඳුම බලාත්මක කිරීමේ කාලය දීර්ඝ කළ හැකි ය.

**30.** බලපත්‍රලාභියා විසින්, 29 වන රීතිය යටතේ ප්‍රදානය කරන ලද හෝ දීර්ඝ කරන ලද කාලසීමාව තුළ සංසදය විසින් ලබා දෙන ලද විසඳුමක් බලාත්මක කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, සංසදය විසින් එකී අපොහොසත් වීම පිළිබඳ බලපත්‍රලාභියාට දැනුම් දෙනු ලැබිය යුතු අතර එකී කාලසීමාව ඉකුත් වීමේ දින සිට දින තිහක් තුළ කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලැබිය හැකි ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා එම කරුණ කොමිෂන් සභාවට වාර්තා කරනු ලැබිය යුතු ය.

**31.** 30 වන රීතිය යටතේ වන වාර්තාවක් ලැබීමෙන් පසුව, කොමිෂන් සභාව විසින්, කාරණයේ සිද්ධිමය සහ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, සංසදය විසින් එළඹෙන ලද විසඳුම සමඟ අනුකූල වීම සහතික කිරීමට සුදුසු යයි සලකනු ලබන යම් ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකි ය.

## III වන කොටස

### සාමාන්‍ය

**32.** කොමිෂන් සභාවේ මාර්ගෝපදේශය ඇතිව සෑම බලපත්‍රලාභියෙකු විසින් ම, මේ රීති ක්‍රියාත්මක වනු ලබන දිනයේ සිට මාස දහ අටක කාලසීමාවක් තුළ සංසදය වෙත දුක්ගැනවිලි භාර දීමේ සහ සහන සැලසීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කරනු ලැබිය යුතු අතර පහත දැක්වෙන දේ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය:-

(අ) සංසදය වෙත භාර දෙන ලද පාරිභෝගික දුක්ගැනවිලි ලියාපදිංචි කිරීම, විස්තර සොයා බැලීම සහ වාර්තාගත කිරීම සඳහා සම්පූර්ණ ලෙස ඩිජිටල්කරණය කළ පද්ධතියක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ආ) බලපත්‍රලාභියා සමඟ සම්බන්ධ වීම මගින් දුක්ගැනවිල්ලක් විසඳා ගනු ලැබිය හැකි ද යන්න පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා යම් පාර්ශ්වයකට හැකියාව ලබා දීම පිණිස කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ සහ එක් එක් බලපත්‍රලාභියාගේ වෙබ් අඩවියේ ඩිජිටල් ද්වාරයක් ලබා දීම;

(ඇ) පාරිභෝගිකයා විසින් බලපත්‍රලාභියාව විමසිය යුතු බව ඩිජිටල් ද්වාරය විසින් දක්වනු ලබන අවස්ථාවක දී හෝ පාරිභෝගිකයාට ඩිජිටල් ද්වාරය හරහා ලබා දෙන ලද ප්‍රතිචාරය සම්බන්ධයෙන් අතිරේක තොරතුරු අවශ්‍ය වන අවස්ථාවක දී, අදාළ සංසදය වෙත ලිඛිතව දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කිරීමට පහසුකම් සැලැස්වීම;

(ඈ) දුක්ගැනවිල්ල සම්බන්ධයෙන් ලබා දෙන ලද විසඳුම පිළිබඳ පාරිභෝගිකයා සෑහීමකට පත්නොවන අවස්ථාවක දී, යම් පාරිභෝගිකයකු විසින් කොමිෂන් සභාව වෙත දුක්ගැනවිල්ලක් යොමු කිරීමට පහසුකම් සැලැස්වීම;

(ඉ) සංසදයට ඉදිරිපත් කරන ලද සෑම දුක්ගැනවිල්ලක් සඳහා ම ලියාපදිංචි කරනු ලබන අවස්ථාවේ දී, අනන්‍ය යොමු අංකයක් නිකුත් කිරීම;

(ඊ) එක් එක් දුක්ගැනවිල්ල පිළිබඳ සහන සැලසීම සඳහා ගන්නා ලද සියලු ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා එක ම පද්ධතියක් තුළ පවත්වාගෙන යාම සහ ලැබූ සියලු දුක්ගැනවිලි පිළිබඳ සම්පූර්ණ ඩිජිටල් ලේඛනයක් පවත්වාගෙන යාම;

(උ) සංසදය වෙත දුක්ගැනවිල්ල ලැබුණු දින සිට දින තිහක් තුළ සංසදය විසින් සෑම දුක් ගැනවිල්ලක් ම සලකා බලා විසඳනු ලබන බව සහතික කිරීම; සහ

(ඌ) සංසදය විසින් එළඹෙන ලද විසඳුම සමගින් පද්ධතියේ ඇති එක් එක් දුක්ගැනවිල්ලට අදාළව සංසදයේ කටයුතු පිළිබඳ සටහන්, එම අනුරූප දුක්ගැනවිල්ල ඉදිරියෙන් වාර්තා කිරීම.

**33.** එක් එක් දුක්ගැනවිල්ල විසඳනු ලැබීම දක්වා, දක්වන ලද ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ කාර්යය සඳහා, සංසදය ඉදිරියේ ඇති සියලු කටයුතු ඇතුළු එක් එක් දුක්ගැනවිලි පිළිබඳව කටයුතු කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය දෙස බැලීමට සහ ඒ පිළිබඳව සමාලෝචනය කිරීමට සෑම අවස්ථාවක දී ම, කොමිෂන් සභාවට ප්‍රවේශය තිබිය යුතු ය.

**34.** සංසදය විසින්, එක් එක් කාර්තුව අවසන් වී දින පහළොවක් ඇතුළත, ලැබුණු දුක්ගැනවිලි සංඛ්‍යාව විසඳන ලද සහ විසඳමින් පවතින දුක්ගැනවිලි සංඛ්‍යාව, එකී දුක්ගැනවිලි විසඳන ලද ආකාරයද සමග දක්වමින් කාර්තුමය වාර්තාවක් බලපත්‍රලාභියාට පිටපතක් ද සහිතව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**35.** සංසදය විසින් එක් එක් වර්ෂයේ අප්‍රේල් මාසය අවසානයේ හෝ අප්‍රේල් මාසය අවසන් වීමට පෙර පූර්ව මුදල් වර්ෂය තුළ සංසදයේ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාවක්, කොමිෂන් සභාවට පිටපතක් ද සහිතව බලපත්‍රලාභියා වෙත සපයනු ලැබිය යුතු ය.

**36.** සංසදය විසින් 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ විධිවිධානවලට යටත්ව, මේ රීති යටතේ දුක්ගැනවිලි ඉදිරිපත් කරන්නා වූ පාරිභෝගිකයන්ගේ පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

**37.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ රීතිවල -

"පනත" යන්නෙන්, 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අදහස් වේ;

"පාරිභෝගිකයා" යන්නේන්, බලපත්‍රලාභියකු හෝ ශ්‍රී ලංකා රජය හෝ මහජනතාවට විදුලිය සැපයීමේ ව්‍යාපාරයේ නියුතු වෙනත් යම් තැනැත්තකු විසින් පෞද්ගලික භාවිතය සඳහා විදුලිය ලබා දී ඇති යම් තැනැත්තකු අදහස් වන අතර, විදුලිය ලබා ගැනීමේ කාර්යය සඳහා තත් කාලයේ දී සම්බන්ධ කර ඇති පරිශ්‍රයක් අයිති තැනැත්තකු ද විදුලිබලය අපේක්ෂිතව සිටින පාරිභෝගිකයකු ද ඇතුළත් විය යුතු ය;

"පාරිභෝගික උපදේශකවරයා" යන්නෙන්, නියමිත අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසුව කොමිෂන් සභාවේ ලියාපදිංචි කරන ලද සහ දුක්ගැනවිලි පිළිබඳ ක්‍රියා කිරීමේ ක්‍රියාවලිය පුරාවට ස්වකීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා

ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන් නියෝජනය කිරීමට බලය පවරන ලද යම් තැනැත්තකු හෝ අස්ථිත්වයක් අදහස් වේ;

"ඉලෙක්ට්‍රොනික ක්‍රමය" යන්නෙන්, මාධ්‍යය කවරක් වුව ද ඉලෙක්ට්‍රොනික, චුම්භක, දෘෂ්ටික හෝ වෙනත් යම් ඒ හා සමාන ශක්තියක් මගින් තොරතුරක් උත්පාදනය කරන, යවන, ප්‍රතිග්‍රහණය කරන, හෝ ගබඩා කරන යම් ක්‍රමයක් අදහස් වේ;

"දුක්ගැනවිල්ල" යන්නෙන්, පනත යටතේ, ඒ යටතේ සාදන ලද යම් රීතියක් හෝ නියෝගයක් යටතේ, කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද යම් ප්‍රතිපත්තිමය විධානයක් හෝ නියෝගයක් යටතේ හෝ තත්කාලයේ බලපවත්වන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලපත්‍රලාභියකු මත පනවන ලද යම් කාර්යයක් ඉටු කිරීමේ තත්ත්වයේ, ස්වභාවයේ හෝ ආකාරයේ යම් වරදක්, අසම්පූර්ණතාවක්, අඩුපාඩුවක්, ප්‍රමාණවත් නොවන බවක් හෝ පැහැරහැරීමක් සම්බන්ධයෙන් පාරිභෝගිකයකු විසින් කරන ලද පැමිණිල්ලක් හෝ පාරිභෝගික හිමිකම් අහිතකර ලෙස බලපෑමට ලක්වී ඇති බලපත්‍රලාභියකු විසින් සිදු කරන ලද යම් පැමිණිල්ලක් අදහස් වන අතර ඊට -

(අ) බලපත්‍රලාභියා විසින් සපයන ලද යම් සේවයකට හෝ එකී සේවයට සම්බන්ධ යම් තදනන්තර සේවයකට අදාළව යම් පාරිභෝගිකයකු විසින් සිදු කරන ලද යම් ඉල්ලීමක්, එකී ඉල්ලීම -

(i) පළමු අවස්ථාවේ දී; හෝ

(ii) එකී සේවය ලබාගැනීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව,

සිදුකරන්නේ නම්,

(ආ) එකම කරුණට අදාළව සහ එකම පාරිභෝගිකයා හා බලපත්‍රලාභියා අතර යම් අධිකරණයක්, විනිශ්චයාධිකාරයක්, බේරුම්කරුවකු හෝ වෙනත් යම් බලධරයකු ඉදිරියේ විභාග වෙමින් පවතින නඩු කටයුතු සම්බන්ධයෙන් හෝ යම් එවැනි අධිකරණයක්, විනිශ්චයාධිකාරයක්, බේරුම්කරුවකු හෝ වෙනත් යම් බලධරයකු විසින් දැනටමත් දෙනු ලැබ ඇති තීන්දු ප්‍රකාශයක්, ප්‍රදානයක් හෝ අවසන් ආඥාවක් සම්බන්ධයෙන්; සහ

(ඇ) දුක්ගැනවිල්ල සඳහා වන නිමිත්ත ආරම්භ වූ දිනයට වසර දෙකකට වඩා වැඩි කාලයකට පසුව දුක්ගැනවිල්ල ඉදිරිපත් කර ඇති අවස්ථාවක්;

ඇතුළත් නොවිය යුතු ය;

"බලපත්‍රලාභියා" යන්නෙන්, විදුලිය බෙදා හැරීම සම්බන්ධ කටයුතුවල නිරත වීම සඳහා පනත ප්‍රකාර බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව" යන්නෙන් 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අදහස් වේ.

EOG 09 - 0190

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.